කොවිඩ්-19 වසංගතය තවමත් ශ්‍රී ලංකාවෙන් තුරන් වී නැති පසුබිමක, කොවිඩ්-19 මර්දනය සඳහා වන සෞඛ්‍ය නිර්දේශයන් නිසියාකාරව පිළිපැදිය යුතු බව, මාධ්‍ය මගින් නැවත නැවතත් ජනතාව වෙත සිහිකැඳවීම අගනේයි.

මෙසේ සෞඛ්‍ය නිර්දේශයන් සම්බන්ධයෙන් සිහිකැඳවමින්, ස්වර්ණවාහිනී රාත්‍රී ප්‍රධාන ප්‍රවෘත්ති විකාශය (11/10) තුළ, සංචාරකයින්ද සෞඛ්‍ය නීති වලට පටහැනිව හැසිරෙන බව සඳහන් කර තිබූ අතර, ශ්‍රී ලංකාවට පැමිණි විදෙස් සංචාරකයින් පිරිසකගේ දර්ශන පළවී තිබිණි. එහිදී ඔවුන්ගේ අනන්‍යතාවයන් ආරක්ෂා කිරීමට උත්සාහ ගැනීමක්ද දක්නට නොලැබුණි.

1) සෞඛ්‍ය නිර්දේශයන් කඩ කිරීම් සම්බන්ධයෙන් සිහිකැඳවීම් කරනා අතරවාරයේදී වුවත්, පුද්ගලයෙකුට සිය පෞද්ගලිකත්වය සඳහා ඇති අයිතිය, මෙහිදී කඩ නොවන්නේ ද?

2) මෙම සංචාරකයින්ගේ අනන්‍යතාවය හෙළිදරව් නොකරන අතරම, සෞඛ්‍ය නිර්දේශයන් පිළිපැදීමේ වැදගත් කම සඳහන් කිරීමට සහ සෞඛ්‍ය නිර්දේශයන් පිළිපදින ලෙසින් සිහිකැඳවීමට කටයුතු කිරීම වඩාත් යෝග්‍ය යැයි ඔබ සිතන්නේ ද?

මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?